# මිහිමවට අදරැති පරපුරක්
## නිල්ල පිරුණු හෙට දිනක්



අනාගත පරපුර උදෙසා සාරවත් හෙටක් තනාදීමේ භාරදූර කාර්යයට උරදෙන ජේ ජේ ලංකා සමූහය නිල්ල පිරුණු සුවදායි හෙටක් වෙනුවෙන් සිය ප්‍රමුඛ පෙලේ ගැණුම්කරුවකු වන ටෙස්කෝ ආයතනය හා සහසම්බන්ධව අවිස්සාවේල්ල ජනාධිපති විද්‍යාලයේ රුක් රෝපන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. පරිසර හිතකාමී පරපුරක් බිහිකරනු වස් QMS අංශය ප්‍රමුඛ කොට ගෙන මෙම වැඩසටහන දියත් කෙරිණි.



පුංචි මුවඟට සිනහ කැන්දූ - ටිකිරි සිහින මල්එල ගැනුණු දින

දරුවන් යනු රටේත් දැයේත් හෙට දින එලිය කරන තරු කැට  වේ. රටේ ඉදිරි අනාගතය භාර ගන්නට සිටින පුංචි පැටවුන්ගේ දැනුම කුසලතා වර්ධනය කිරීමට පමණක් නොව ක්‍රීඩාව තුළින් ඔවුනගේ ආකල්ප වර්ධනයට ද ගත් උත්සාහයක් ලෙස හුලංදාව දකුණ විද්‍යාලයට අංගසම්පූර්ණ ළමා ක්‍රීඩා උද්‍යානයක් සකස් කොට විද්‍යාලයීය අයිතියට පැවරීම පසු ගිය දා සිදු විය. ටෙස්කෝ ආයතනය හා ඒකාබද්ධව ජේ ජේ සමූහය විසින් සිදු කරන ලද මෙම මාහැගි  සමාජමය සත්කාරය හුදෙක් සමාජමය වගකීමක් ලෙසම පමණක් නොව රටේ අනාගතය සැලසුම් කිරීමේ අඩිතාලමක් වන්නේය.